මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: MOF/GAM/2019/07

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.07. 31

චක්‍රලේඛ අංක : MFMM/DFD/03/2019

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**ගම්පෙරලිය - කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (RRDP) – 2019**

ගම්පෙරලිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2019.01.04 දිනැති අංක MFMM/DFD/01/2019 දරණ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

02. මෙම වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී මහජන නියෝජිතයින්ගේ සහභාගීත්වය ලබා ගැනීමට සහ මහජනතාව විසින් ගම් මට්ටමින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේ පහසුව සැලකිල්ලට ගෙන මේ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ගනු ලැබූ තීරණය පරිදි, ඉහත චක්‍රලේඛයේ 04 ඡේදයේ (ආ), (ඇ) සහ (ඈ) යන වගන්ති මඟින් සඳහන් කෙරෙන උපදෙස් ක්‍රියාත්මක කිරීම වෙනුවට මහජන නියෝජිතයින් මඟින් අදාල ඡන්ද කොට්ඨාශයේ ව්‍යාපෘති යෝජනා සැපුවම ලබාගෙන එසේ ලබාගත් යෝජනා අදාල කාර්ය ක්ෂේත්‍ර 12 යටතට අයත්වන බවට තහවුරු කිරීමෙන් අනතුරුව, එම ව්‍යාපෘති සඳහා අදාල ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරු වෙත නිදහස් කිරීමට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත යැවීමට තීරණය කරණ ලදී.

03. ඒ අනුව, MFMM/DFD/01/2019 අංක දරණ 2019.01.04 දිනැති චක්‍රලේඛයේ 04 ඡේදයේ (ආ), (ඇ) සහ (ඈ) යන වගන්ති සම්බන්ධව ඔබ විසින් කටයුතු කිරීම අවශ්‍ය නොවන බව දන්වා සිටිමි.

04. එහෙත්, අනුමත කළ ව්‍යාපෘති, අදාල කාර්ය ක්ෂේත්‍ර 12 තුල සඳහන් උපරිම පිරිවැය සීමාවන් ඉක්මවා නොයන පරිදි ක්‍රියාත්මක කර, එම ව්‍යාපෘති වලට අදාල සියලු බිල්පත් 2019.09.30 දිනට පෙර පියවීමට වග බලා ගත යුතුය.

**ආර්.එච්.එස්. සමරතුංග**
**භාණ්ඩාගාරයේ ලේකම්**

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශ
4. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
5. විගණකාධිපති
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
9. ව්‍යාපෘති අධ්‍යක්ෂ, ගම්පෙරලිය ලේකම් කාර්යාලය